**<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>**

**<u>රැකියා විරහිත උපාධිධාරීන්/ඩිප්ලෝමාධාරීන් රැකියාගත කිරීම - 2020 යටතේ බඳවාගත් උපාධිධාරීන්/ඩිප්ලෝමාධාරීන් ස්ථිර පදනමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීම - 2022 iii අදියරයේ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ දැන්වීම.</u>**

උපාධිධාරී අභ්‍යාසලාභීන් ස්ථිර පදනම මත මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට අදාළ **iii** අදියරයේ සම්මුඛ පරීක්ෂණය ඉදිරි දිනකදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

සම්මුඛ පරීක්ෂණ සඳහා **<u>ඔබට වෙන්කර ඇති දිනය හා වේලාව ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ</u>**. තවද මින් ඉදිරියට මෙම බඳවා ගැනීමට අදාලව සිදුකරනු ලබන දැනුම්වත් කිරීම් අපගේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** හි පළ කරන බැවින් එම වෙබ් අඩවිය පරිශීලනය කරන ලෙස ද කාරුණිකව දන්වමි.

සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් **<u>ලිපි ලේඛනවල මුල්පිටපත් සහ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද එම ලිපි ලේඛනවල ඡායා පිටපත් කට්ටලයක්</u>** සූදානම් කර ගන්නා ලෙස දන්වා සිටිමි.

**I.** උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණුව සඳහා කැඳවීමේ ලිපිය/ දිස්ත්‍රික් ලේකම් විසින් අභ්‍යාසලාභී පුහුණුව සඳහා ආයතනයක් වෙත අනුයුක්ත කරනු ලැබූ ලිපිය

**II.** උප්පැන්න සහතිකය

**III.** ජාතික හැඳුනුම්පත

**IV.** නමේ වෙනසක් ඇත්නම් එය සනාථ කිරීමට දිවුරුම් ප්‍රකාශනයක්

V. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධි සහතිකය සහ උපාධි විෂයයන් හා ප්‍රතිඵල සටහන් සහිත විස්තරාත්මක සහතිකය

**VI.** උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණු කාලසීමාව තහවුරු කෙරෙන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉදිරිපත් කරන ආයතන ප්‍රධානියාගේ නිර්දේශය හා අයදුම්කරුගේ තොරතුරු පත්‍රිකාව (ඇමුණුම 01) **(මුල්පිටපත පමණක් රැගෙන ඒම ප්‍රමාණවත්ය.)**
**** මධ්‍යම රජයේ හෝ වෙනත් පළාත් සභාවක සිට ස්ථාන මාරුවී පැමිණ ඇත්නම් එම කාල සීමාව සඳහා එම ආයතන ප්‍රධානින්ගේ නිර්දේශ අවශ්‍ය වේ.**

**VII.** ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ **DS 4** සහතිකය. **(මුල්පිටපත පමණක් රැගෙන ඒම ප්‍රමාණවත්ය.)**

* සම්මුඛ පරීක්ෂණ සංවිධානය සඳහා කෙටි කාලසීමාවක් ඇති බැවින් ඉහත සහතික පත්‍ර හා ලියවිලි සූදානම් කර ගැනීම සඳහා වූ පූර්ව දැනුම් දීමකි.